# ජගත් මාතා ඇදහිල්ලේ බලපෑම ලැබූ ශ්‍රී ලංකාවේ ලක්ෂ්මී ඇදහිල්ල

පී.පී. නිමේෂා කුලසිංහ

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*madu70938@gmail.com*

ඉන්දු නිම්නය ආශ්‍රිත කරගත් මොහෙන්දජාරෝ, හරප්පා ශිෂ්ටාචාර මූලික කරගත් පුරාවිද්‍යාත්මක කැණීම්වලින් දියුණු ශිෂ්ටාචාරයන්ට අයත් තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි විය. ඒ අතර ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ආගමික ඇදහිලි රැසකි. එම ඇදහිලි සමඟ වූ මාතෘ දේව වන්දනාව හෙවත් ජගත් මාතා වන්දනය ප්‍රමුඛ වන්නේය[1]. සශ්‍රීකත්වයට අදිපති දෙවගන ලෙස සැලකෙන ජගත් මාතාව වන්දනා කිරීම තුළින් ස්ව ජීවිත සෞභාග්‍යමත් වන බවට ජනතාව තුල දැඩි විශ්වාසයක් පැවති බව එමඟින් පැහැදිළි වේ. ''අනාවරණය කරගෙන තිබෙන අවශේෂ මත එම ශිෂ්ටාචාරයට අයත් බොහෝ ලොකු, කුඩා නිවාසවල ජගත් මාතාව ඇදහීම සඳහා වෙන් කළ විශේෂ ඉඩක් පැවති බවට සලකුණු හඳුනාගත හැකි ව තිබේ. මේ සමාන ඇදහිලි පැවති බව තහවුරු කරන ටෙරාකොටා ස්ත්‍රී රූප රැසක් ඉන්දු නිම්නය ආශ්‍රිත ව පමණක් නොව ඊජිප්තුව, පලස්තීනය, සුලු ආසියාව, බෝල්කන් අර්ධ ද්වීපය, සිරියාව වැනි සමකාලීන ශිෂ්ටාචාරවලින් ද අනාවරණය වී තිබේ. ඒවා බොහෝමයක් මැටි මාධ්‍ය කොටගත් ඒවා ය. ඒ අතර පිදුරු වැනි අමුද්‍රව්‍ය උපයෝගී කර ගත් අවස්ථා ද වේ. මෙම පිළිරූ සහ මූර්ති ඇතැමක් දුම් වැදී අවපැහැ ගැන්වී ඇති ආකාරයක් ඒවා තුළින් නිරූපණය වීම විශේෂ ලක්ෂණයකි.''[2]

මෙසේ සොයා ගන්නා ලද ජගත් මාතා පිළිරූ වර්ග තුනකට වර්ගීකරණය කර තිබේ. ඒවා නම්,

- ජගත් මාතාවගේ කන්‍යාභාවය දක්වන පිළිරූ
- ජගත් මාතාවගේ ගර්භණී අවධිය නිරූපණය කරන පිළිරූ
- ජගත් මාතාවගේ මවු සෙනෙහස නිරූපිත පිළිරූ

යනාදියයි. ''මවු දෙවගන හෙවත් ජගත් මාතා වන්දනය පශ්චාත් වෛදික යුගයේ ආගමික ඇදහිලි සඳහා ද බලපා තිබේ. පසුකාලීන පාර්වතී, මහා

[1] www.divaina.com

[2] www.e-thaksalava.moe.gov.lk

දේවී, සති, ගෞරි, කාළි, චණ්ඩි යන ඇදහිලි මවු දෙවගනගේ ම විවිධ ස්වරූප ලෙස හඳුනාගත හැකි ය. වර්තමානයේ ඉන්දියාවේ දක්නට ලැබෙන ග්‍රාම මාතා වන්දනය ද මීට සමාන ය. මහායාන ධර්ම සංකල්පයට අයත් ශක්ති වන්දනාව සඳහා ද මෙම ජගත් මාතා සංකල්පයේ ආභාසය ලැබී තිබෙන බව තුලනාත්මක අධ්‍යයනයේ දී පැහැදිළි වන කරුණකි''. හින්දු ආගමික ආභාසය ඇසුරේ ශ්‍රී ලංකාවේ පසුකාලීන ව ඇති වූ ලක්ෂ්මී වන්දනාව සඳහා ද මෙම ජගත් මාතා සංකල්පයේ වක්‍ර බලපෑම ලැබී තිබෙන බව අධ්‍යයනයේ දී පැහැදිළි වන කරුණකි.

සශ්‍රීකත්වය යන සංකල්පය අර්ථයට ලඝු කළ විට එමඟින් අදහස් වන්නේ, "ඇවැසි දෙය ඇවැසි පමණින් ඇත" යන අදහස ය. එය කලාත්මක චිත්ත සංකල්පනාවෙහි ලා පිරිපුන් බව චිත්‍රණය කරන චිත්‍ර රූපකය මවන්නකි. සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් වන්දනයට ලක්කළ හා කරන්නාවූ ජගන්මාතා, ලක්ෂ්මී, ග්‍රාම මාතා ආදී දේවතා රූ කෙරෙහි පැරණි කලාකරුවා විසින් පිරිපුන් බවක් ලබා දෙන්නට ඇත්තේ මෙම කරුණ නිසා වන්නට ඇත. පුරාවිද්‍යා කැණීම් මඟින් අනාවරණය කරගත්තා වූ අවශේෂ මෙන් ම සාහිත්‍ය ගත කරුණු ද ඒ බව සනාථ කරනු ලබයි. බොහෝ විට අඩ නිරුවත් ලෙසින් නිමවා තිබෙන ජගත් මාතාව පිරිපුන් ස්ත්‍රී රුවක් සහිත ය. පුළුල් ලැමක් පුළුල් උකුලක් මෙන් ම පිරිපුන් කළවා යුගලක් සහිත ව නිරූපණය කර තිබෙන ඇය වචනයේ පරිසමාප්ත අරුතින් ම ජගත් මාතාව හෙවත් විශ්වය බිහි කළ මාතාව සංකේතවත් කරයි.

ජීවියෙක් බිහි කිරීම විෂයෙහි ලා කාන්තාව වෙතින් සුවිශාල දායකත්වයක් ලැබේ. බිහි කළ ජීවියා විෂයෙහි රැකවරණය හා පෝෂණය ලබා දීමෙහිලා ද ස්ත්‍රීය තුළින් විශාල මෙහෙයක් ඉටු වේ. එය අත්දුටු පැරණි කලාකරුවා විශ්වයේ සම්භවය පිළිබඳ මැවූ සංකල්පනාවෙහි ලා කාන්තා රුවක් යොදා ගැනීමට අපේක්ෂා කළා විය හැකි ය. ඉපැරණි ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මාතෘ මූලික වීම කෙරෙහි ද මෙම සංකල්පය බලපෑම් කරන්නට ඇත. එම සංකල්පය මවු කොටගත් වන්දනයේ අවස්ථාවක් ලෙස මෙරට ලක්ෂ්මී වන්දනය දක්වාලිය හැක ිය. මහාචාර්ය ටී.පී කුලතුංග මහතාට අනුව මෙන් ම පරණවිතානට අනුව ලක්ෂ්මී වන්දනය නිසැකයෙන් ම ඉන්දු නිම්නයේ ජගත් මාතා වන්දනයෙන් බිඳී ආවකි. ලක්ෂ්මී දේවිය නිරූපණය කරන හැම විටක ම පිරිපුන් හැඩතල ලබා දීමට කලාකරුවා උත්සහ කර තිබේ.

ඍග් වේදයේ දැක්වෙන පරිදි ලක්ෂ්මිය කාම කිහිපයකින් හඳුනාගැනේ. ශ්‍රී ලක්ෂ්මී දෙවගන ලොව පහළ වන ආකාර දහයක් තිබෙන බව හින්දු විශ්වාසයයි. එනම්,

- රාජ ලක්ෂ්මිය
  (රජුගේ පතිනිය)
- භෝග ලක්ෂ්මිය
  (සතුටට අධිපතිනිය)
- වීර ලක්ෂ්මිය
  (වීරත්වයට අධිපතිනිය)
- ගෘහ ලක්ෂ්මිය
  (ගෘහයට අධිපතිනිය)
- ගජ ලක්ෂ්මිය
  (ධනයට අධිපතිනිය)

- බ්‍රහ්ම ලක්ෂ්මී (ආධ්‍යාත්මික සංවර්ධනයට අධිපතිනි)
- රූප ලක්ෂ්මී (රූපශ්‍රීයට අධිපතිනිය)
- නෘත්‍ය ලක්ෂ්මී (කලාවට අධිපතිනි)
- ප්‍රඥා ලක්ෂ්මී (නුවණට අධිපතිනි)
- සර්ව රෝග නිවාරණ ලක්ෂ්මී (නිරෝගී බවට අධිපතිනි)

යනාදි ලෙෂ ය.[3] ලක්ෂ්මී දේවිය හැඳින්වීම උදෙසා යොදාගෙන තිබෙන සෙසු නාම අර්ථ අනුව ද ඒවාගෙන් අදහස් වන්නේ සශ්‍රීකත්වයට සමාන අදහස් ය. කරිසිනී යන නමින් ද ඇය ආමන්ත්‍රණය කෙරේ. එහි අදහස, "පසේ සරු බව ඇතිකරන්නී" යන්න ය. ඇතැම් අවස්ථාවල ඇය නාභියෙන් හටගත් ලතාවක් සහිත ව නිරූපණය කර තිබෙන්නේ මෙම අරුතින් විය හැකි ය. රාජ්‍යට සශ්‍රීකත්වය ලබා දෙන ඇය රාජ්‍ය ශ්‍රී නමින් ද හැඳින්වේ. කෙසේ වුව ද ක්‍රි.පූ 200 කරම් ඉතිහාසයක පටන් ලොව පුරා ලක්ෂ්මී වන්දනය ප්‍රචලිත ව පැවත තිබේ. කෙසේ නමුත් ලක්ෂ්මී දේවියගේ සම්භවය පිළිබඳ ව එකිනෙක වෙනස් කතා පුවත් කිහිපයකි. ඒ අතරින් වඩාත් ප්‍රචලිත කතා පුවත් කීපයක් භාරතීය සාහිත්‍යයේ සඳහන් ය. ඒ මෙසේ ය.

සුර අසුරයින් කළ සංග්‍රාමයේ දී මහා කාල නම් නාග රාජයා ලවා මහාමේරුව දණ්ඩක් සේ ගෙන මහා කිරි සයුර කැළඹීමේ දී හමු වූ මුල් ම වස්තුව ශ්‍රී ලක්ෂ්මියයි. ඇය ප්‍රථමයෙන් අසුරයින් අතට පත් වුව ද ඒ වනවිට ඓරාවන හස්තියා සුරයන් සතු වූ නිසා ඇය ස්ව කැමැත්තෙන් සුරයන් සන්තක වී තිබේ. ශිව හා විශ්ණු යන දෙදනා ම සුරයන් වුව ද ලක්ෂ්මිය සන්තක කර ගැනීමට සමත් වී ඇත්තේ විෂ්ණු බව විෂ්ණු පුරාණය තුල මෙන් ම මහා භාරතය තුළ ද සවිස්තරාත්මක ව කියවේ. ඇය වටා ගෙතී ඇති මීළඟ පුවත නම් ඇයට කිරි මුහුද වාස භවන වූයේ එක්තරා ඍෂි වරයෙකුගේ ශාපයක් නිසා බව ය. එක්තරා ඍසිවරයෙක් ධ්‍යාන බලයෙන් අහසේ සැරිසරන විට පොළවේ එක් උයනක මඳ කිපී කෙළි දෙලෙන් හැසිරුණ මුව දෙනක් දක තිබේ. රාගාන්විත හැඟීම් ඇතිකිරීමට සමත් වූ මෙම දර්ශනය නිසා ඍෂිවරයාට කාම තණ්හාව ඇති වී සැණකින් ජීව දාතු පහ වී තිබේ. එම ජීව ධාතුවලට දාව නෙලුම් මලක් මත ශ්‍රී ලක්ෂ්මිය උපන් බව කියවේ. කෙසේ වුව ද වෛදික පුරාවෘතවලට අනුව ඇය ඉපදී ඇත්තේ විෂ්ණුගේ නාභියෙනි.

"ලක්ෂ්මිය කෙසේ උපන් බව කියැවුන ද ලක්ෂ්මී වන්දනය මෙරට හා භාරතය තුළ පමණක් නොව ආසියාව පුරා ම පැතිරුණු විශ්වාසයක් විය. ඍග් වේදයට අනුව එක් අවස්ථාවක ඉපැරණි හින්දු ජනයා ලක්ෂ්මී දෙවගනට කන්නලව් කොට ගිතෙල් ඉල්ලා සිටි බව කියවේ. ඉපැරණි බ්‍රාහ්මීය පොත පතට අනුව ලක්ෂ්මිය පිදීමේ අවස්ථා සුලබ ය. නමුත් ඇතැමෙකුගේ මතය වන්නේ මහා ප්‍රජාපතී දේවිය වන්දනා කිරීම පසු කාලීන ලක්ෂ්මී දේව ඇදහිල්ල බවට පරිවර්තනය වූ බව ය. නමුත්

---

[3] http;//si.mwikipidia.org

පුරාවිද්‍යාත්මක අනාවරණ හමුවේ එම තර්ක නිශේදනය ඉතා පහසුවෙන් ම සිදුවේ".[4]

මහායාන කෘතියක් වන ශ්‍රී මහා දේව ව්‍යාකරණම් නම් කෘතියට අනුව ලක්ෂ්මීය අනාගත බුදු වරයෙකු ලෙස නියත විවරණ ලබා තිබේ. ප්‍රත්‍යශතකයට අනුව ඇය බෙලි වනය, කොලොම් මල් ගොටුව, ඇත් කුම්භතලය, ඡත්‍රය, ධජය, චාමරය, පියුම් වනය, කිරි ගව සමූහය, ශ්‍රී විෂ්ණුගේ උරය යනා දී තැන්වල වැඩ වෙසෙන බව 63 වැනි ශ්ලෝකයෙන් කියවේ. මීට අමතර ව දර්ශනීය පවිත්‍ර තැන් තොරණ ද්වාර ආසන, මැණික්, ඇත් අස් ගව සමූහ අතර ලක්ෂ්මීය වැඩ වෙසෙන බව විශ්වාස කෙරේ. "නිල්වන් ජල තලය මත පිපුණු රත් නෙලුමක් ඇයගේ වාස භවන වන අතර ඇය අත් සතරකින් යුතු දෙවඟනක් ලෙස නිරූපණය කර තිබේ. අත් දෙකකින් නෙලුම් මල් පොහොට්ටු දරා සිටින ලක්ෂ්මීය තවත් අතකින් රන් කාසි බඳුනක් හෝ පූර්ණ ඝටයක් දරයි. තවත් අතකින් මල් විශේෂයක් ද දරා සිටී." මත්ස්‍ය පුරාණයට අනුව හා අග්නි පුරාණයට අනුව ඇය එක් අතකින් ශ්‍රී ඵල දරන්නීය. ශ්‍රී පල යනු බෙලි හෝ දිවුල් විය හැකි ය. පැරණි භාරතීය කවි තුළ මෙන් ම ලාංකික සංදේශ කාව්‍ය තුළ ලක්ෂ්මී රූපය මනා රූප සම්පත්තියකින් යුතු බවට වර්ණනාවට බඳුන් වී ඇත. සන්දේශ කාව්‍ය තුළ ඇය සිරිකත, සිරි සඳ, පියුමම්බා යන නම්වලින් ද හඳුන්වා ඇත.

ශ්‍රී ලංකාවේ ලක්ෂ්මී ඇදහිල්ල කොතෙක් දුර ඉතිහාසයකට දිවෙන්නේ ද යන්න නිශ්චිත ව කිව නොහැකි ය. නමුත් එය නිසැකයෙන් ක්‍රිස්තු පූර්ව 02 වැනි සියවස දක්වා දිවෙන බව පුරාවිද්‍යාත්මක ව තහවුරු වී තිබේ. අනුරාධපුර ඇතුළු නුවර කැණීම් මගින් සොයාගත් තඹ කාසි හා ලෝහ තහඩුවලින් ඒ බව තවත් තහවුරු වේ. අභයගිරි විහාර කැණීම්වලින් ලක්ෂ්මී රුව සහිත කාසි බොහොමයක් හමුවී තිබේ.

භෞතික ධනවත් බව හා කාසි අතර පවතින සබඳතාව ලක්ෂ්මී දෙවඟන කාසිය මත නිරූපණය කරන්නට බලපෑම් කරන්නට ඇත. මෙම කාසි වල නිරූපණය වන ලක්ෂ්මී දේවිය නිසැක ලෙස හඳුනාගැනීම සඳහා ඇය දෙපසින් සිට ඇයව අභිශේක කරනු ලබන ඇත් රූ දෙක උපකාරී විය. මෙවැනි කාසි කිරිබත්වෙහෙර, ථූපාරාමය, හලාවත, තිස්සමහාරාමය, යාපනය, පොළොන්නරුව යන ප්‍රදේශ රැසකින් හමු වී තිබෙ. මෙම කාසි චතුරස්‍රාකාර වීම මත මෙම කාසි විනිමය මාධ්‍යක් නොව ආභරණයක් ලෙස පැළඳ ඇති බවට ද තර්කයක් ඉදිරිපත් විය. ශ්‍රී ලංකාවේ ඇදහිමට ලක් වූ අෂ්ට මංගල වස්තු අතර ශ්‍රී වත්ස යනු ලක්ෂ්මීය බව කියවේ. රුවන්වැලි සෑයේ දකුණු ආයක කැණීමක දී මැටි බඳුන්වල තැම්පත් කර තිබූ අගල් 3ක් පමණ උස ඇත්දළවලින් නෙලන ලද නග්න ස්ත්‍රී රුවක ඉන බැදි මෙවුල් හා ශිවාභරණ අනුව ඇය නිසැකයෙන් ම ලක්ෂ්මී දේවිය විය හැකි බව කඹුරුපිටියේ වන රතන හිමි අනුරාධපුරයේ නටඹුන් නම් කෘතිය තුළින් අදහස් කරයි. විචාරාත්මක විමසුමේ දී සාංචි හා භාරුත් යන

[4] www.e-thakslava.moe.gov.lk

කැටයම්වල ද මේ ආකාරයේ ස්ත්‍රී රූප හඳුනාගත හැකි ය. ඒවා තුළ එක් අතකින් ජනනේන්ද්‍රිය ආවරණය කරගත් කැටයම් තුළින් නිරූපණය වන්නේ උපත යන සංකේතය විය හැකි ය.

දීඝවාපී චෛත්‍ය කැටයම් අනුව සද්ධාතිස්ස රජ අවධියේ දී ලක්ෂ්මී වන්දනය ප්‍රබල ලෙස පැවති බව කියැවේ. මෙම කැටයම් දනට අම්පාර කෞතුකාගාරයේ තැම්පත් කර තිබේ. නිශ්ශංකමල්ල රජුට අයත් (ක්‍රි.ව. 1187-1196) ගල්පොත සෙල්ලිපියේ ද ලක්ෂ්මී රුව දක ගත හැකි ය. මීට අමතර ව නාලන්ද ගෙඩිගේ උළුවස්සක ද මහනුවර ශ්‍රී දළදා මාළිගයේ විෂ්ණු දේවාලයේ රන් දෝළියක ද, කැටයම් කර තිබෙනු අදටත් දක ගත හැකි ය.[5] ලක්ෂ්මී රුව බොහෝ විට යොදා ඇත්තේ තොරණවල හා දොරටුවල ය. එම නිසා එහි අරමුණ සශ්‍රීකත්වය හා සෞභාග්‍ය බව තවත් තහවුරු වේ. මිහින්තලය කණ්ඨක චෛත්‍ය වාහල්කඩ කැටයම් අතර ද, යාපහුව රජ මාළිගයේ මකර තොරණෙහි ද දළදා මාළිගයේ පහළ මාලයේ දකුණු දොරටුවේ කැටයම් අතර ද උඩ අළුදෙණිය විහාරයේ හා දෙවුන්දර දේවාලයේ උළුවස්සක දක්වෙන කැටයම් අතර ද ලක්ෂ්මී දේවිය වැඩ සිටීමෙන් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ. මීට අමතර ව බෞද්ධ සාහිත්‍යයේ දක්වෙන පරිදි අනිථ පිණ්ඩික රජුගේ මාළිගයේ උළුවස්සේ ද ලක්ෂ්මී රුවක් වූ බව කියවේ.''ලක්ෂ්මී රුව නිරූපණය කරන්නා වූ අත් සතරින් හින්දු දර්ශනයේ ඇති අත් සතරින් හින්දු දර්ශනයේ ඇති අරමුණු සතර වන ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන කරුණු සංකේතවත් කෙරේ''.ඒ අනුව ලක්ෂ්මී යන වචනය පවා ව්‍යුත්පන්න වී ඇත්තේ, "අරමුණ දන සිටීම" යන අරුතින් ය. නෙලුම් මල යනු හින්දු දර්ශනයට අනුව සංකේතාර්ථයකි. එමඟින් බාධක නොසලකා නෙලුම් මලක් මතුවන්නා පරිදි සෞභාග්‍යට මතුවිය හැකි බව මතක් කර දෙයි. ''ඇත් සංකේත මඟින් ශක්තිය , ජලය යන්න සංකේතවත් කරන අතර ලක්ෂ්මී රුව සමග කලාතුරකින් දකිය හැකි බකමූණු රුව, ධනය හා දනුම හමුවේ ලෝභය අත්හරින බව සංකේතාත්මක ව සිහිපත් කරනු ලබයි. බකමූණා යනු දිවා කාලයේ ඇස් නොපෙනෙන සතෙක් ලෙස ඉපැරණි ජනයා දක්නට ඇත.'' එය කලා නිර්මාණය උදෙසා ගලපාගෙන ඇත්තේ අපූර්ව සංකේතාර්තයකිනි.[6]

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


බස්නායක,ටී.එච්,හෙට්ටිගේ,යූ, (2007) *ජගත් කලා ප්‍රවේශ*ः එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

www.divaina.com

www.e-thaksalava.moe.gov.lk

www.widusara.com

http;//si.mwikipidia.org


[5] www.widusara.com

[6] www.e-thakslava.moe.gov.lk